**ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 ජූලි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයේ සේවය හැරගිය හා සේවයෙන් පහකල නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.2,202,325 ක් වූ අතර, ඉන් රු.129,316 ශේෂයක් වසර 20 ඉක්මවූ ඒවා විය. | 2023 දෙසැම්බර් 31 දිනට මෙය ණය ශේෂයෙන් රු.514,775 ක ණය ශේෂයක් මේ වන විට අය වී ඇත. | ණයශේෂ අයකිරීම සඳහා අඛණ්ඩව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණයශේෂයන් රු.957,800 ක් වූ අතර, එයින් රු.61,050 ක ශේෂයන් වසර 1 – 3 අතර හා රු.138,040 ක ශේෂයන් වසර 3 – 5 අතර විය. | 2023 දෙසැම්බර් 31 දිනට සේවය අතහැර ගොස් ඇති, සේවයෙන් පහ කල හා සේවය අවසන් කල හා වැඩ තහනම් නිලධාරීන්ගේ අය නොවූ ණය ශේෂයෙන් රු.514,775 ක ණය ශේෂයක් මේ වන විට අය වී ඇත.<br>හිඟ ණය ශේෂ අය නොවීමට ඇපකරුවන් නොමැති වීම, ඇතැම් නිලධාරීන්ගේ පදිංචිය තහවුරු කර ගැනීමට නොහැකි වීම, පිරිවැය අධික බැවින් නඩු පැවරීමට නොහැකි වීම හේතුවී ඇති බව | ණය ශේෂ අයකර ගැනීමට අඛණ්ඩව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | විශ්‍රාම ගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂයන් වසර 3 ක් ඉක්මවන ලද ඒවා විය. | අය වීමට ඇති ශේෂයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 හි (4) (i) පරිදි 2024.12.31 දිනට පෙර මෙම ණය ශේෂයන්ගෙන් අයකර ගත නොහැකි ණය ශේෂ කපා හැරීමට කටයුතු කරනු ලබන බව. | අයකිරීම් සිදුකිරීමට අඛණ්ඩව ක්‍රියාමාර්ග ගතයුතු අතර ඉතිරි ශේෂ සම්බන්ධව චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (iv) | මියගිය නිලධාරීන් 6 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.513,432 ක් වූ අතර, ඒ අතුරින් වසර 1 – 3 අතර රු.379,472 ක්ද වසර 3 – 5 අතර රු.133,960 ක් ද විය. | අය වීමට ඇති ශේෂයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 හි (4) (i) 2024.12.31 දිනට පෙර මෙම ණය ශේෂයන්ගෙන් අයකර ගත නොහැකි ණය ශේෂ කපා හැරීමට කටයුතු කරනු ලබන බව. | ණය ශේෂ අයකිරීමට උපරිම ක්‍රියාමාර්ග ගත යුතු අතර, ඉතිරි ශේෂ සම්බන්ධව චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**(ආ) තැන්පතු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් තැන්පත් ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.68,566,929 ක් වූ අතර එම ශේෂය තුල රු.67,098,666 ක් වසර දෙකකට වඩා කල් ඉකුත් වූ තැන්පතු විය. එකී තැන්පතු ශේෂ අතුරින් රු.67,018,647 ක ශේෂය මෙහෙවර පියෙස ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් කරන ලද තැන්පතු බවට අනාවරණය විය. | දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් තැන්පත් ගිනුමේ 2023 දෙසැම්බර් 31 දිනට රු. 68,566,929 ක් වූ අතර එම ශේෂය තුල රු.67,098,666 ක මුදල වසර 02 ඉක්මවූ ශේෂය වේ. ඉන් මෙහෙවර පියසා ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල රු.67,018,647 ක තැන්පතු ශේෂයෙන් මේ වන විට රු.16,327,781 ක ශේෂයක් ඉතිරිව පවතින බව. | තැන්පතු ගිණුම් ශේෂ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුල කම්කරු දෙපාර්තමේන්තුවේ හා දිස්ත්‍රික් කම්කරු කාර්යාලවලට අයත් පොදු තැන්පතු ගිණුම්වල නිරවුල් නොවූ තැන්පතු ශේෂය රු.894,089,604 ක් අදාල කේවල ගිණුම්වලට බැර කිරීමෙන් තොරව රඳවා තිබුණි. මෙම ශේෂයන් අතුරින් වසර 10 ට වැඩි ශේෂය රු.71,131,941 ක්ද වසර 2 ට වැඩි ශේෂය රු.177,155,982 ක්ද විය. | කොලඹ ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණ මගින් සේවක අර්ථසාධක අරමුදල් අයකිරීම් අංශය හරහා පොදු තැන්පත් ගිණුම වෙත ලැබෙන අයකිරීම් නිරවුල් කිරීම වෙනුවෙන් ස්ථාවර කමිටුවක් පත් කර වසර 02 ට වැඩි ශේෂය නිරවුල් කිරීම වෙනුවෙන් විධිමත් ක්‍රමවේදයන් මේ වන විටත් සකස් කරමින් පවතින බව. | පොදු තැන්පතු ශේෂ නිරවුල් කර සාමාජිකයන් වෙත ගෙවීම් කිරීමට කටයුතු කල යුතු බව. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදල් අංශයේ තොරතුරු පද්ධතිය බලගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ මිලදීගත් රු.22,462,587 ක් වූ වත්කම්, 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වත්කම් මිලදීගැනීම් ලෙස වාර්තා කර තිබූ අතර, 2023 වර්ෂයේ සේවක අර්ථසාධක අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශනවලද වත්කම් ලෙස වාර්තා කර තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් මේ සම්බන්ධව උපදෙස් විමසා ඇති බැවින් හැකි ඉක්මණින් පිළිතුරු සැපයීමට පියවර ගන්නා බව. | වත්කම් ශේෂයන් නිරවුල් කරගැනීමට කටයුතු කල යුතුය. |

**(ඈ) අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ අනෙකුත් ශීර්ෂයන් විසින් අත්තිකාරම් ‘බී’ ගිණුමට කරන ලද බැරකිරීම් ශේෂය හා භාණ්ඩාගාර ප්‍රකාශන අනුව බැරකිරීම් අතර රු.193,403 ක වෙනසක් නිරීක්ෂණය විය. | අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් බී ගිණුමට සිදු කරන ලද හර කිරීම් හා බැර කිරීම් ගණනය කිරීමේදී මෙම දෝෂය සිදු වී ඇති අතර මින් ඉදිරියට එවැනි දෝෂ ඇති නොවන පරිදි කටයුතු කරනු ලබන බව. | අග්‍රිම ශේෂයන් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

**(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **හානි පිළිබඳ ලේඛනය**<br>දෙපාර්තමේන්තුව විසින් හානි පාඩු සම්බන්ධව ලේඛණයක් පවත්වා තිබුණද එම ලේඛනය දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාලවල තොරතුරු යාවත්කාලීනව පවත්වා නොතිබුණු බවට නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව විසින් හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන යන අතර, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල වල තොරතුරු යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 2 කට අදාලව සලසා තිබූ රු.126,000,000 ක් වූ ප්‍රතිපාදනයන්ගෙන් සමාලෝචිත වර්ෂය තුල කිසිදු වියදමක් දරා නොතිබීමෙන් සියයට සියයක ප්‍රතිපාදන ඉතිරිවීම් නිරීක්ෂණය විය. | 221-1-1-2-2104-66 වැය විෂයට අදාල මෙහෙවර පියෙස ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව අවසාන බිල්පත ගෙවීමට අවශ්‍ය ලියවිලි ව්‍යාපෘති උපදේශන ආයතනය විසින් අනුමත කර එවා නොමැති වීම, හේතුවෙන් මෙම ප්‍රතිපාදන හා 221-1-1-2-2102-11 වැය විෂයට අදාල ජාතික අයවැය චක්‍රලේඛ 3/2022 අනුව ප්‍රාග්ධන වියදම් සීමා කිරීම හා හදිසි මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් ඇති නොවීමෙන් මෙම ප්‍රතිපාදන උපයෝජනය සිදු කිරීමට නොහැකි වූ බව. | වෙන්කරගත් ප්‍රතිපාදන මනා ලෙස උපයෝජනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයන් 14 කට අදාලව සලසා තිබූ රු.1,381,150,000 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.102,105,930 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මෙම ඉතිරියේ ප්‍රතිශතය සියයට 48 සිට සියයට 97 ක් දක්වා පරාසයක් තුල පැවතුණි. | ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරීමට ප්‍රමාදවීම හා අපේක්ෂිත පරිදි සැලසුම්කල කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි වීම.<br>ජාතික අයවැය චක්‍රලේඛ 3/2022 අනුව ප්‍රාග්ධන වියදම් සීමා කිරීම හේතුවෙන් හා හදිසි මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් ඇති නොවූ බව. | වෙන්කර ගත් ප්‍රතිපාදන කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතයට ගත යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මු.රෙ.770 (4) | රජයේ ආයතනවල අබලන් වූ පාවිච්චි කල නොහැකි වාහන හඳුනාගැනීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ධාවන තත්ත්වයේ පවතින නමුත් ආර්ථික වශයෙන් ඵලදායී නොවන හෝ වෙනත් විශේෂ කරුණක් මත අපහරණය කළ යුතු වාහන හඳුනාගත යුතු වුවද එසේ සිදුකර නොතිබුණි. | වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 05/2020 හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි විධිවිධාන අනුව කම්කරු දෙපාර්තමේන්තුව තුල පවතින ධාවනයෙන් ඉවත් කර ඇති වාහන සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා 2024.05.30 දිනැතිව පුද්ගලයන් පස් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර ඇති අතර, වාහන අපහරණය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරගෙන යනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 | කොන්ත්‍රාත් පැවරීමේදී විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹිය යුතු වුවද, අවස්ථා 09 කදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පූර්ව ඇස්තමේන්තුගත මුදල වූ රු.480,719,000 වන කොන්ත්‍රාත්තු සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් මුදල් ගෙවා තිබුණි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව එකී කාර්යයන් රු.272,689,000 ක වටිනාකමට උපකොන්ත්‍රාත්කරුවන් වෙත පවරා තිබුණි. මෙම පිරිවැයෙහි වෙනස සේවා ලබාගැනීමේ කාර්යයන් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කරමින් උපදේශන සේවා ආයතන හා කොන්ත්‍රාත්කරුවන් කම්කරු දෙපාර්තමේන්තුව මඟින් තෝරා ගන්නා බැවින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මුදල් හෝ ප්‍රතිපාදන ලබා දීමක් සිදු නොවේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ලෙස දක්වා තිබූ නමුත් ඒ පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ නිසි අධීක්ෂණයක් සිදුවී නොතිබුණි. | | |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 පරිච්ඡේදය | කම්කරු දෙපාර්තමේන්තුවේ හා ප්‍රාදේශීය කාර්යාලවල අවශ්‍ය ඉදිකිරීම් කටයුතු සිදුකරවා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රම අනුගමනය කිරීමකින් තොරව අවස්ථා 22 කදී රු.346,651,027 ක් වටිනා කොන්ත්‍රාත් 22 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත සෘජුවම පිරිනමා තිබුණි. | 2023 වර්ෂයේ සිට කම්කරු දෙපාර්තමේන්තුව මගින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මුදල් හෝ ප්‍රතිපාදන ලබා දී පෙර පරිදි ඉදිකිරීම් කාර්යයන් සෘජුවම පිරිනැමීම නවතා ඇති අතර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් උපදේශන සේවාව පමණක් ලබා ගැනීමටත් ඒ සඳහා වන උපදේශන ගාස්තු එම දෙපාර්තමේන්තුව වෙත ගෙවීමත් කම්කරු දෙපාර්තමේන්තුව මගින් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම ප්‍රසම්පාදන ක්‍රමවේදය හරහා සිදුකිරීමටත් කටයුතු කර ඇති බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඈ) | 2019 සැප්තැම්බර් 27 දින අංක 2142/90 දරණ අති විශේෂ ගැසට් පත්‍රය | ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව කර්මාන්තශාලා ලියාපදිංචිය හා හුමාල බොයිලේරු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය අවම මට්ටමක පැවතුණි. | දැනටමත් සෑහීමකට පත්වන මට්ටමින් සිදු කර ඇති අතර ඒ සඳහා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල මට්ටමින් ලියාපදිංචි කිරීමේ ලේඛන පවත්වාගෙන යන අතර ලියාපදිංචිය වැඩිකිරීම සඳහා විද්‍යුත් තැපැල මගින් හා තැපැල් මගින් සිහි කැඳවීම් සිදු කරනු ලබයි. තවද කම්කරු දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියේ එක් මොඩියුලයක් ලෙස දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල බොයිලේරු ලියාපදිංචිය ඇතුළු අනෙකුත් දත්ත ඇතුලත් කිරීමට මූලික අධ්‍යයනය සිදු කරමින් පවතින බව. | බොයිලේරු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව සිදුකල යුතුය. |

## 2.3 කොන්ත්‍රාත් සම්බන්ධයෙන් බදු අයකර ගැනීම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ | මේ සඳහා අදාලව සියලු පාර්ශවයන් එක්ව 2024.01.08 දින පවත්වනු ලැබූ | ඉදිකිරීම් කොන්ත්‍රාත්තු නිසි අධීක්ෂණයෙන් |

| | | |
|---|---|---|
| පළමු මහල අභ්‍යන්තර නිර්මිත සැකසීම සඳහා 2022 මාර්තු 31 දින රු.60,005,000 ක මුදලක් ගෙවා තිබූ අතර, මෙම ව්‍යාපෘතියට මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 12, 16 මහල්වල අභ්‍යන්තර නිර්මිත සැකසීමට දෙන ලද මුදලින් රු.37,632,000 ක් ද, මාරු කර එකතු වන රු.99,637,000 ක කොන්ත්‍රාත්තුවක් පවරා තිබුණද, 2023 දෙසැම්බර් 31 දක්වා එකී කාර්යයේ ප්‍රගතියක් නිරීක්ෂණය නොවීය. | ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තාවට අනුව 95% ක භෞතික ප්‍රගතියක් මේ වනවිට අත්පත් කර ගෙන ඇත. නමුත්, ඉදිකිරීම් භාර ගැනීමට පරීක්ෂා කිරීමේදී දෝෂ ලෙස හඳුනාගෙන ඇති ඇලුමිනියම් ජනෙල් රාමු අලුතින් සපයා සවි කිරීම මුලින් හඳුනා නොගත් මේ වනවිට නව තාක්ෂණය සමග හඳුනාගෙන ඇති ෆයිබර් අන්තර්ජාල සැපයුම සඳහා සම්බන්ධ කල හැකි Manageable Switches සවි කිරීම වැනි කාර්යයන් කඩිනමින් නිරාකරණය කර කාර්යය සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කරමින් පවතින බව. | සිදුකල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙහෙවර පියෙස 04 වන මහලේ ආපනශාලාවේ අභ්‍යන්තර නිර්මිත සැකසීම සඳහා 2021 දෙසැම්බර් 30 දින රු.72,000,000 ක මුදලක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විටත් මෙකී කාර්යය සිදුකර නොතිබූ අතර, මෙම මුදලින් රු.67,957,507 ක් නැවත කම්කරු දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන තිබුණි. ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යයන්ද මෙතෙක් ඉටුවී නොතිබුණි. | මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 04 වන මහලේ ආපනශාලාවේ අභ්‍යන්තර නිර්මිතය සැකසීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු. 72,000,000.00ක මුදලක් ලබා දී ඇති අතර එම මුදලින් රු. 3,968,000.00ක් මෙහෙවර පියෙස ගොඩනැගිලේ ප්‍රධාන මෙහෙයුම් කාමරයේ බෙදුම් ඇදි සැකසීම සඳහා යොදාගෙන ඇත. ඉතිරි මුදල ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් 2023.12.31 දින නැවත ලබා දී ඇත. | ව්‍යාපෘති මගින් අපේක්ෂිත කාර්යය ඉටුකර ගත යුතුය. |
| (ආ) | කෑගල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සේවා පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව මත රු.31,000,000 ක් 2022 පෙබරවාරි 17 දින ගෙවා තිබුණද, එකී කාර්යය මෙතෙක් අවසන්ව නොපැවතුණි. | රට තුළ පැවති කොවිඩ් වසංගත තත්වය හා ආර්ථික අර්බුද හේතුවෙන් මෙම කාර්යය අතරමග නවතා දමන ලදි. ඉන්පසු වෙළඳපලේ භාණ්ඩ හා අමුද්‍රව්‍ය මිල ඉහළ යාම හේතුවෙන් සිදුකල යුතු අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා පමණක් ඇස්තමේන්තු සංශෝධනය කර ගොඩනැගිල්ලේ බිම් මහලේ සේවා පහසුකම් වැඩිදියුණු කරන ඇත.<br>ඉතිරි ප්‍රතිපාදන මගින් මහජන රැඳවුම් | ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් අවසන් කරගැනීමට කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| | ස්ථානයක් සකස් කිරීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතින අතර එම කාර්යය අවසන් වීමෙන් පසු ඉතිරි මුදල් කම්කරු දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කරනු ලබන බව. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරන ලද රු.127,687,802 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 06 කින් රු.48,663,802 ක් වූ කාර්යයන් 4 ක් අවසන්ව නොතිබුණි. රු.72,000,000 ක් පිරිවැය ඇස්තමේන්තුවක් මත පිරිනමන ලද මෙහෙවර පියෙස 4 වන මහල අපනශාලා අභ්‍යන්තර නිර්මිත සැකසීමේ කාර්යභාරයද අවසන්ව නොතිබූ අතර, එම ප්‍රතිපාදනවලින් මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ ප්‍රධාන මෙහෙයුම් කාමරයේ බෙදුම් ඇඳි සැකසීම සඳහා රු.3,968,000 ක ප්‍රතිපාදන සලසාදී තිබුණි. | සිදුකරමින් පවතින කාර්යයන් මේ වසර අවසන් වනවිට අවසන් කිරීමට කටයුතු කරන බව. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරන ලද කාර්යයන් ඉටුකරවා ගැනීමට කටයුතු කල යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ මුද්‍රණ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා 2007 වර්ෂයේ දෙසැම්බර් මස රු.21,884,083 ක් වැයකර මිලදී ගෙන තිබූ මුද්‍රණ යන්ත්‍රයක් හා ඊට අමතරව මුද්‍රණාලයේ ක්‍රියාකාරීත්වයේ පවතින පරිගණක යන්ත්‍රයක්, ලැප්ටොප් පරිගණකයක්, බැඳුම් යන්ත්‍රයක් හා කඩදාසි කැපීමේ යන්ත්‍රයක් (Paper Cutter) පැවතුණි. මෙම මුද්‍රණාලයෙහි මුද්‍රණ අංශයේ රාජකාරි ඉටුකිරීමට ස්ථිර කාර්යය මණ්ඩලයක් හා අමුද්‍රව්‍ය නොමැතිවීම නිසා එකී සම්පත් 2018 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පැවතුණි. | මෙහි සඳහන් උපකරණ ක්‍රියා කරවීම සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් කම්කරු දෙපාර්තමේන්තුව සතුව නොසිටි බැවින් අලුතින් තනතුරු අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ අතර ඒ සඳහා කාර්ය මණ්ඩල සමාලෝචනයේදී සලකා බලන බවට දන්වන ලද බව හා ඒ සඳහා කිසිදු සාධනීය ප්‍රතිචාරයක් නොලැබුණු බව. | දෙපාර්තමේන්තුව සතු සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිත කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රු.7,855,576 ක මුදලක් වැයකර හම්බන්තොට දිස්ත්‍රික් කම්කරු කාර්යාලය හා සංචාරක බංගලාව අළුත්වැඩියා කර තිබුණද, අවශ්‍ය ලී බඩු හා උපකරණ ප්‍රසම්පාදනය නොවීම හේතුවෙන් සංචාරක බංගලාව භාවිතයට ගැනීමෙන් තොරව පැවතුණි. | ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව භාණ්ඩ මිලදී ගැනීම් තාවකාලිකව අත්හිටවූ බැවින් හම්බන්තොට දිස්ත්‍රික් කම්කරු කාර්යාලය හා සංචාරක බංගලාව සඳහා ලී බඩු හා උපකරණ මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොමැත. එමෙන්ම, මේ වනවිට භාවිතා නොකරන කාර්යාල ගොඩනැගිලි වෙනත් කාර්යාල ස්ථාපිත කිරීම සඳහා ලබා දීමට උපදෙස් ලැබී ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව. | දෙපාර්තමේන්තුව සතු සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතයට ගත යුතුය. |

**3.4 කළමනාකරණ දූර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගම්පහ දිස්ත්‍රික් නව කම්කරු කාර්යාලයේ බෙදුම් ඇඳි සකස් කිරීම හා ජාලකරණ පද්ධතිය සැකසීමට ඇස්තමේන්තුගත පිරිවැය ලෙස රු.4,000,000 ක් ඇස්තමේන්තු කර, 2023 දෙසැම්බර් 27 දින රු.11,727,646 ක ප්‍රතිපාදන ගම්පහ දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කර තිබුණද එකී කාර්යය 2024 මැයි මස දක්වාම ඉටු වී නොතිබුණි. | මෙම කාර්යයට අදාල ඉතිරි රු.7,559,023 ක මුදල 2024 වර්ෂයේදී ගම්පහ දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දෙන ලදි. පෙර සඳහන් පරිදි මෙම කාර්යය ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව විචලායක් ලෙස (Variation) එම උපදේශන ආයතනය හා සම්බන්ධව සිදුකරනු ලබයි. 2024.06.25 දින වනවිට මෙහි ප්‍රගතිය 40%ක් පමණ බව. | ප්‍රතිපාදන ලබාදුන් කාර්යභාරය නිමකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේදී කොග්ගල නේවාසිකාගාරයේ වැසිකිළි පද්ධතියේ සිදුකල යුතු අළුත්වැඩියාවන් සඳහා රු.6,000,000 ක් වෙන් කර තිබුණද එකී කාරයයන් ඉටු කිරීමට අපොහොසත්ව පැවතුණි. | ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව අත්‍යාවශ්‍යම කාර්යයන් පමණක් සිදුකල යුතු බැවින් කොග්ගල නේවාසිකාගාරයේ සිදුකල යුතු අත්‍යාවශ්‍ය කටයුතු ගොඩනැගිලි නඩත්තු අංශය විසින් රු.90,140 ක් වැය කර සිදුකරන ලදි.<br>කම්කරු දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල වල සිදුකල යුතු අළුත්වැඩියා කටයුතු පිළිබඳව සැලකීමේදී කටුනායක නේවාසිකාගාරයේ පවතින අඩුපාඩු හදිසියේ සිදුකල යුතු අළුත්වැඩියාවන් නොවූ බැවින් 2023 වර්ෂයේදී අළුත්වැඩියා කටයුතු සිදුනොකරන ලදි. නමුත්, එම ගොඩනැගිල්ලේ සිදුකල යුතු | ප්‍රතිපාදන වෙන්කරගැනීම් හා භාවිතය නිසි පරිදි සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අළුත්වැඩියා කටයුතු සියල්ල පිළිබඳ අධ්‍යයනය කර සියලුම කාර්යයන් එක් ව්‍යාපෘතියක් ලෙස සලකා 2024 වර්ෂයේදී සිදුකිරීමට නියමිතය. | |
| (ඇ) | මෙහෙවර පියෙස පොදු පහසුකම් හා කසල කළමණාකරණය, නාම පුවරු, අමුත්තන්ගේ හැඳුනුම්පත් ඇතුළු පහසුකම් සපයා ගැනීමේ කාර්යය උදෙසා අනුමත රු.55,000,000 ක ප්‍රතිපාදන පැවතියද ඇස්තමේන්තු සකස් කිරීම, සාකච්ඡා කිරීම මිල කැඳවීම් අදියරවල පවතින බවට අනාවරණය විය. | • රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි හවුල්කාරීත්වය යටතේ මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 04 වන මහලේ පිහිටි ආපනශාලාව, 31 වන මහල වැනි පොදු පහසුකම්හි ක්‍රියාකාරීත්වය, වෙනස් වන බැවින් හා කම්කරු මහලේකම් කාර්යාලයේ මහල් වෙනත් ආයතන වෙත ලබා දීමට නියමිත බැවින් එහිදී කාර්ය මණ්ඩල පිරිස වැඩි වන බැවින් කසළ කළමනාකරණය සඳහා යෝජිත සැලැස්ම මේ වනවිට සංශෝධනය කලයුතුව ඇති බව.<br>• නාම පුවරු සකස් කිරීමේ කාර්යය මේ වනවිට සිදුකරමින් පවතින බව.<br>• අමුත්තන්ගේ හැඳුනුම්පත් පද්ධතිය සැකසීමේ කාර්යය සඳහා කිහිප වරක් මිල ගණන් කැඳවීම් සිදුකලද කිසිදු ආයතනයක් විසින් මිල ගණන් ඉදිරිපත් කර නොමැති බව. | ප්‍රතිපාදන වෙන්කරගන්නා ලද කාර්යයන් නිසි පරිදි ඉටු කරවා ගැනීමට කටයුතු කලයුතුය. |

**5. යහපාලනය**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම 01 පරිදි සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමේ කාර්යභාරය අවසන්ව නොතිබුණි. | සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය මඟින් සෑම කාර්යාලයකම වාර්ෂිකව සිදු කරන ප්‍රගති මෙහෙයුම් පරීක්ෂණ මඟින්ද සේවක අර්ථසාධක අරමුදල් දත්ත පද්ධතිය මඟින් ලබා ගන්නා මාසික වාර්තා මඟින්ද ලබා දෙන සේවාවන් එම අංශ මඟින් අධීක්ෂණය කරනු ලැබේ.<br>එමෙන්ම මාණ්ඩලික නිලධාරීන් සඳහා සහ ප්‍රාදේශීය කම්කරු කාර්යාලයන් සඳහා කාර්ය සාධන ඇගයීමේ ක්‍රමවේදයක් සහ ප්‍රගතිය අගය කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා මේ වන විට කමිටුවක් පත් කර ඇති අතර ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |